සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2018**

**නාට්‍ය හා රංග කලාව - සිංහල I**
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

**57 S I**

**2018.08.15 / 0830 - 1140**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ........................................

| | |
|---|---|
| **I කොටස** | |
| **මුළු ලකුණු** | **40** |

**උපදෙස්:**

* **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** 'නෘත්ත' පිළිබඳ දැක්වෙන නිවැරදි වගන්තිය තෝරන්න.
(1) නෘත්ත යන්න නට් ධාතුවෙන් ප්‍රභවය වූවකි.
(2) ශුද්ධ නැටුම හෙවත් රිද්මානුකුල ගාත්‍ර වික්ෂේපයයි.
(3) ආහාර්ය හා සාත්ත්වික අභිනය පමණක් භාවිත වේ.
(4) රිද්මයක්, අර්ථයක් හා මනෝභාවයක් පළ කරයි.
(5) නාට්‍යශාස්ත්‍රයෙහි මේ පිළිබඳ කිසිවක් සඳහන් ව නැත. (.........)

**2.** ප්‍රාසංගික කලා අතර නාට්‍ය කලාව වෙනස් වන්නේ,
(1) ලිඛිත පිටපතක් අවශ්‍ය වන බැවිනි.
(2) චතුර් අභිනය භාවිත වන බැවිනි.
(3) නළු-නිළියන් පිරිසක් සහභාගි වන බැවිනි.
(4) සෙසු ප්‍රාසංගික කලාවන්ට වඩා වැඩි රංග කාලයක් අවශ්‍ය වන බැවිනි.
(5) ලෝකධර්මී හා නාට්‍යධර්මී වශයෙන් ප්‍රභේද වන බැවිනි. (.........)

**3.** රූපවාහිනිය හා ප්‍රාසංගික කලා අතර වෙනස දැක්වෙන පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) රූපවාහිනිය ප්‍රේක්ෂකයා හා සජීවී ලෙස සම්බන්ධ නොවේ.
(2) රූපවාහිනියේ රූපණය දක්වනුයේ කැමරාවක් ඉදිරිපිට ය.
(3) රූපවාහිනී වැඩසටහන් කලින් නිර්මාණය කොට ගබඩා කර තැබිය හැකි ය.
(4) රූපවාහිනිය ගෘහස්ත පරිභෝජන භාණ්ඩයක් වේ.
(5) රූපවාහිනී වැඩසටහන් සඳහා ශබ්දය, සංගීතය පසු ව එක් කළ හැකි වේ. (.........)

**4.** ප්‍රාසංගික කලාවට නොමැති සිනමාව සතු ශක්‍යතාව වන්නේ,
(1) රූපණය ඉතා ප්‍රබල ලෙස උපයෝගී කරගත හැකි වීම ය.
(2) ගැටුම් අවස්ථා නිරූපණය කළ හැකි වීම ය.
(3) උචිත පිටපතක් උපයෝගී කරගත හැකි වීම ය.
(4) විවිධ ආනුෂංගික කලාවන් උපයෝගී කරගත හැකි වීම ය.
(5) එක ම කාල වේලාවක දර්ශන වාර ඕනෑ ම සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකි වීම ය. (.........)

**5.** පහත නාට්‍ය අතුරෙන් බැලේ නාට්‍යයක් වන්නේ කුමක් ද?
(1) කැලෑමල් (2) දෙපානෝ (3) කරදිය
(4) පේමතෝ ජායතී සෝකෝ (5) නට් ක්‍රැකර් (Nut Cracker) (.........)

[දෙවැනි පිටුව බලන්න.

**6.** ඔපෙරාවට අයත් වන්නේ කුමක් ද?
(1) සැළලිහිණි සන්දේශය (2) හංසවිල
(3) නලදමයන්ති (4) අග්නි
(5) නිදි කුමරිය (The Sleeping Beauty) (.........)

**7.** අභිනය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) සංවාද, දෙබස්, ස්වගත භාෂණ, ගීත, වාචික අභිනයට අයත් ය.
(2) නාට්‍යශාස්ත්‍රයෙහි සාත්ත්වික භාව අටක් දැක්වේ.
(3) චාරී, ස්ථානක, හස්ත හා කරණ ආංගික අභිනයේ ප්‍රභේද වේ.
(4) සාත්ත්වික අභිනය යනු 'බැහැරින් ගෙන එන ලද දෑ' යන අර්ථය යි.
(5) දර්ශන පසුතල, පරිසරය ආදිය මැවීමට වාචිකාභිනයට හැකි ය. (.........)

**8.** සංස්කෘත නාට්‍යයේ 'ප්‍රාප්ත්‍යාශා' සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අර්ථෝපක්ෂේප පහෙන් එකකි.
(2) සංස්කෘත නාට්‍යයේ සන්ධි වර්ගයකි.
(3) නේතෘ ගේ අරමුණ ඉටු වේ ද නො වේ ද යන ශංකාව ප්‍රේක්ෂකයා තුළ හටගන්නා අවස්ථාව යි.
(4) නේතෘ ගේ බලාපොරොත්තුව ප්‍රේක්ෂකයාට දැනගැනීමට සැලසෙන අවස්ථාව යි.
(5) නේතෘ ගේ බලාපොරොත්තුව ඉටු වන බව ප්‍රේක්ෂකයාට වැටහෙන අවස්ථාව යි. (.........)

**9.** රත්නාවලී, ප්‍රියදර්ශිකා, නාගානන්ද නම් සංස්කෘත නාට්‍යත්‍රයේ කතුවරයා,
(1) ශ්‍රී හර්ෂ ය. (2) ශූද්‍රක ය. (3) භාස ය.
(4) කාලිදාස ය. (5) අශ්වඝෝෂ ය. (.........)

**10.** ග්‍රීක නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඊඩිපස්, ඇන්ටිගනී හා ෆිලොක්ටීටීස් සොෆොක්ලීස් ගේ ත්‍රෛරූපක ගණයට අයත් වේ.
(2) සොෆොක්ලීස් ඇරිස්ටෝටල් ගේ කාව්‍යශාස්ත්‍රය හදාරා ඒ අනුව නාට්‍ය රචනා කළේ ය.
(3) ජ්‍යෙෂ්ඨතම ශෝකාත්ම නාට්‍ය රචකයා යුරිපිඩීස් ය.
(4) ශෝකාත්ම නාටකය උත්පාද වන්නේ ඇපොලෝනියානු වතාවත් පදනම් ව ය.
(5) සොෆොක්ලීස් ශෝකාත්ම නාටක හැරුණු විට සටුර නාටක ද ලියා ඇත. (.........)

**11.** ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ ගායන වෘන්දය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පැරණි ග්‍රීසියේ වෘන්ද ගායකයෝ රංගනයේ යෙදුණේ නැත.
(2) තෙස්පිස් ගායන වෘන්ද ගායකයකු විනා නළුවෙකු නො වේ.
(3) ඊඩිපස් නාට්‍යයේ ගායන වෘන්දය තීබ දේශයේ වයෝවෘද්ධ ජනයා ය.
(4) සොෆොක්ලීස් ගායන වෘන්දය දොළසක් දක්වා අඩු කළේය.
(5) ඊස්කිලස් ගායන වෘන්දය වැදගත් කොට නො සැලකී ය. (.........)

- **12** සිට **17** දක්වා ප්‍රශ්න අංකවලට අදාළ ව සපයා ඇති පහත සඳහන් නාම අතර එක් නාට්‍ය සම්ප්‍රදායකට අදාළ වන **නාම** 03ක් බැගින් ඇත. එම නාමවල අක්ෂර ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

| | | |
|---|---|---|
| A - වලාකුළු | G - ක්‍රිස්ටෝෆර් මාර්ලෝ | M - ඇරිස්ටොෆනීස් |
| B - සකලජන | H - ශූද්‍රක | N - කන්ජින්චෝ |
| C - භාස | I - ක්වන්නමි කියොත්සුගා | O - ඉචි-නො-මත්සු |
| D - තෝමස් කිඩ් | J - මණ්ඩුකයෝ | P - ඌරුභංග |
| E - නෙම්බුත්සු ඔදොරි | K - දෙවැනි එඩ්වඩ් | Q - ද ට්වෙල්ෆ්ත් නයිට් |
| F - පුෂ්කදෙන් | L - ඔතොකොගත | R - කෝපුස් ක්‍රිස්ටි |

**12.** සංස්කෘත නාට්‍යය (.........,.........,.........)

**13.** ග්‍රීක කොමඩි නාට්‍යය (.........,.........,.........)


**14.** එළිසබෙතීන නාට්‍යය (.........,.........,.........)

**15.** මධ්‍යකාලීන නාට්‍යය (.........,.........,.........)

**16.** නෝ නාට්‍යය (.........,.........,.........)

**17.** කබුකි නාට්‍යය (.........,.........,.........)

● සපයා ඇති ඡායාරූපයේ දැක්වන්නේ 'නෝ' රඟහලකි. ඒ ආශ්‍රයෙන් **18** සිට **20** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**18.** 'A' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) අගෙමකු ය. (2) සන්-නො-මත්සු ය. (3) කගමී ඉත ය.
(4) මෙත්සුකෙ බෂිර ය. (5) ජී උතයිෂ ය. (.........)

**19.** 'B' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ඉචි-නො-මත්සු ය. (2) අතොෂ ය. (3) හෂිගකරි ය.
(4) මෙත්සුකෙ බෂිර ය. (5) කගමී ඉත ය. (.........)

**20.** 'C' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) අතොෂ ය. (2) නි-නො-මත්සු ය. (3) කගමී ඉත ය.
(4) කගමිනොම ය. (5) හෂිගකරි ය. (.........)

**21.** නාට්‍යයක රංග වින්‍යාසය සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) රංග වින්‍යාසය අදාළ වන්නේ නාට්‍යධර්මී ශෛලියට නිෂ්පාදනය වන නාට්‍යවලට පමණි.
(2) ප්‍රංශ ජාතික රාඋල් ෆායියේ 1699 දී කොරියොග්‍රැෆික් (Choreographic) නම් ග්‍රන්ථයක් රචනා කොට ඇත.
(3) රංග වින්‍යාසය යනු කලාත්මක හා රිද්මානුකූල අංග චලන සමුදායකි.
(4) 1986 දී සුගතපාල ද සිල්වාට මරාසාද් නාට්‍යයේ රංග වින්‍යාසය උදෙසා සම්මානය හිමි විය.
(5) මයිකල් ජැක්සන් වේදිකාව මත ඉදිරිපත් කළේ ඔහු විසින් ම සකසාගන්නා ලද රංග වින්‍යාසයකි.
(.........)

● රංග කලාවේ මූලිකාංග සම්බන්ධ පහත දැක්වෙන කරුණු/පද ඇසුරින් **22 - 26** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - අවස්ථා | F - පසුතල | K - රඟමඬල |
| B - අධ්‍යක්ෂ | G - විභාව | L - සූත්‍රධාර |
| C - වේෂභූෂණ | H - සිද්ධි | M - ව්‍යභිචාරිභාව |
| D - කරළිය | I - අර්ථපති | N - කථා වස්තුව |
| E - භාව | J - ප්‍රොසීනියම | O - සංගීතය |

**22.** නාට්‍යයේ පෙළ හා සම්බන්ධ වන්නේ,
(1) A, H හා N ය. (2) A, I හා J ය. (3) A, N හා O ය. (4) B, E හා C ය. (5) J, K හා N ය. (.........)

**23.** නාට්‍ය නිෂ්පාදනය හා සම්බන්ධ වන්නේ,
(1) B, I හා L ය. (2) I, J හා L ය. (3) B, L හා O ය. (4) D, G හා O ය. (5) I, L හා N ය. (.........)

**24.** වේදිකාව හැඳින්වෙන නාම වන්නේ,
(1) B, I හා J ය. (2) D, F හා N ය. (3) D, I හා J ය. (4) D, J හා K ය. (5) E, F හා K ය. (.........)

**25.** ආනුෂංගික අංග වන්නේ,
(1) C, K හා M ය. (2) C, F හා O ය. (3) D, F හා M ය. (4) C, M හා O ය. (5) F, J හා O ය. (.........)

**26.** ප්‍රේක්ෂක රස වින්දනය හා සම්බන්ධ වන්නේ,
(1) A, E හා M ය. (2) E, M හා O ය. (3) E, G හා M ය. (4) E, J හා N ය. (5) C, F හා N ය. (.........)

**27.** නාට්‍යයක තිර භාවිතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යවනිකා, ජවනිකා, පටී, තිරයට පර්යාය නාම ලෙස භාවිත කළේ සංස්කෘත නාට්‍යයේ පමණි.
(2) ප්‍රොසීනියම් වේදිකාවේ ප්‍රධාන තිරයට අමතර තිර කිසිවක් නැත.
(3) එළිසබෙතීන යුගයේ ඒප්‍රන වේදිකාවේ ප්‍රධාන තිරයක් වී ය.
(4) සංස්කෘත නාට්‍යයේ රංග පීඨය හා රංග ශීර්ෂය අතර තිරයක් විය.
(5) කබුකි නාට්‍යයේ ප්‍රේක්ෂාගාරය හා වේදිකාව අතර තිරයක් නැත. (.........)

**28.** නළුවකු ආංගික හා සාත්ත්වික අභිනය මගින් විවිධ උපකරණ හා පරිසර මවන රංගභූමි අලංකරණ ක්‍රමය කුමක් ද?
(1) සංකේතාත්මක (2) ද්‍රව්‍යමය (3) ආලෝක උපක්‍රම
(4) සංකල්ප රූපමය (5) ඉඟි හා අභිරූපණ (.........)

- පහත සඳහන් පද/සංකල්පන ආශ්‍රයෙන් **29 - 32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට අදාළ පද 03කි. එම පදවලට අදාළ අක්ෂර ප්‍රශ්නය ඉදිරියේ ඇති හිස්තැනෙහි යොදන්න.

| | | |
|---|---|---|
| A - චිත්‍රිත වස්ත්‍ර | E - හරස් තිරය | I - ගොබෝ |
| B - අහස් තිරය | F - ත්‍රිමාණ උපකරණ | J - මල්දම් |
| C - හැලජන් පහන | G - වර්ණ පෙරණ | K - තිරස්කරිණී |
| D - පසුතල | H - මකුට | L - ආභරණ |

**29.** රංගභූමි අලංකරණවලට අයත්: (......... , ......... , .........)

**30.** වේදිකා තිරවලට අදාළ : (......... , ......... , .........)

**31.** රංගභූමි ආලෝකය හා සම්බන්ධ : (......... , ......... , .........)

**32.** වේෂභූෂණවලට අයත් : (......... , ......... , .........)

**33.** G.L. යන කෙටි නාමයෙන් හඳුන්වන්නේ කුමන ආලෝක ක්‍රමය ද ?
(1) භ්‍රමේක්ෂ පහන (2) අලෝක බුබුළු වැට
(3) සෙවනැලි නිර්මිත පහන් (4) දර්ශන ප්‍රක්ෂේපකය
(5) සාමාන්‍ය ආලෝකය (.........)

**34.** ක්ෂණික නිරූපණය සම්බන්ධ නිවැරදි පිළිතුර ප්‍රකාශය තෝරන්න.
(1) පරිකල්පනය ක්ෂණික නිරූපණය සඳහා අවශ්‍ය නො වේ.
(2) ක්ෂණික නිරූපණය රූපණ කුශලතා වර්ධනයේ ලා උපකාරී වේ.
(3) ක්ෂණික නිරූපණය හුදු අනුකරණයක් පමණි.
(4) කුතුහලය ආදි නාට්‍යමය වශයෙන් වැදගත් දෑ මෙහි ලා අදාළ නො වේ.
(5) මේ සඳහා නිශ්චිත මාතෘකාවක් අත්‍යවශ්‍ය ය. (.........)

**35.** නාට්‍යයක 'ගැටුම' සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 'ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත' යනු ඇලඩයිස් නිකොල් ගේ කියමනකි.
(2) ගැටුම මගින් කුතුහලය සහ ආතතිය රඳවාගැනීමේ ඉඩ අඩුරාලයි.
(3) නාට්‍යයේ චරිත අතර මෙන් ම භූමිකා අතර ද ගැටුම් ඇත.
(4) ගැටුමේ සාර්ථක බව නාට්‍ය රසය කෙරෙහි බලපෑමක් නො කරයි.
(5) ඇරිස්ටෝටල් සහ භරතමුනි මේ පිළිබඳ ව සාකච්ඡා කොට ඇත. (.........)

**36.** නාට්‍ය කලාවේ 'භූමිකා' පිළිබඳ දැක්වෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජුලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස් උත්තුංග රෝමයකු ගේ භූමිකාව ඉටු නො කරයි.
(2) ඇන්ටිගනී නාට්‍යයේ රජ පියා ගේ භූමිකාව අමතක කරයි.
(3) ඔතෙලෝ නාට්‍යයේ ඩෙස්ඩමෝනාට නිශ්චිත භූමිකාවක් නැත.
(4) එක් චරිතයකට භූමිකා කීපයක් රඟ පාන්නට වීමෙන් නාට්‍යය රසය හීන වේ.
(5) රූපණ අභ්‍යාසවල භූමිකා රංගනයට වැදගත් තැනක් හිමි නොවේ. (.........)

**37.** ස්වාභාවිකවාදය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම රීතියේ පුරෝගාමියා ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් ය.
(2) ද බුචර්ස් (The Butchers) නාට්‍යයේ සැබෑ හරක් මස් වේදිකාවේ එල්ලා තැබූ බව කියැවේ.
(3) තෙරේස් රැක්වින් (Therese Raquin) ස්වාභාවිකවාදී නාට්‍යයක් නො වේ.
(4) මෙම රීතියේ අපේක්ෂාව වූයේ නළුවා සිය චරිතයෙන් දුරස්ත වීමයි.
(5) හෙන්රික් ඉබ්සන් ස්වාභාවිකවාදය අනුගමනය කළේ ය. (.........)

**38.** යථාර්ථවාදී නාට්‍ය පිළිබඳ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) යථාර්ථවාදය නැගී එන්නේ රොමැන්ටික්වාදයට එරෙහි ව ය.
(2) ඇන්ටන් චෙකොෆ්, බර්නාඩ් ෂෝ, මැක්සිම් ගෝර්කි යථාර්ථවාදී නාට්‍යකරුවෝ ය.
(3) යථාර්ථවාදී නාට්‍ය කලාව වර්තමානය වන විට අභාවයට ගොස් ය.
(4) ප්‍රේක්ෂකයා තත්ත්වානුරූපී මායාවක රැඳවීම මෙම රීතියේ අපේක්ෂාවයි.
(5) මෙම නාට්‍ය රංගගත කිරීමට වඩාත් සුදුසු ප්‍රොසීනියම් වේදිකාවයි. (.........)

**39.** කෙටි නාට්‍යයක් නිර්මාණය කිරීම සම්බන්ධ උචිත ප්‍රකාශය තෝරන්න.
(1) අනවශ්‍ය සංවාද, සිදුවීම්, නාට්‍යෝපකරණ, චරිත නොයෙදිය යුතු ය.
(2) කෙටි නාට්‍යයක් වන්නේ කෙටි කාල පරාසයක් තුළ රඟ දැක්විය යුතු බැවිනි.
(3) ලංකාවේ කෙටි නාට්‍ය සම්මාන උළෙලක් ආරම්භ වූයේ ක්‍රි.ව. 2000 දී ය.
(4) කෙටි නාට්‍ය නිෂ්පාදනයට කෙටිකතා තෝරාගැනීම අනුචිත ය.
(5) කෙටි නාට්‍ය අධ්‍යාපන මාධ්‍යයක් ලෙස භාවිත කිරීම සුදුසු නැත. (.........)

**40.** ළමා නාට්‍ය පිළිබඳ දැක්වෙන උචිත ප්‍රකාශය තෝරන්න.
(1) ළමා නාට්‍ය පෙළක සංවාද වියත් භාෂාවකින් ලිවිය යුතු ය.
(2) වාංමාලාව පහසුවෙන් වටහාගත හැකි විය යුතු ය.
(3) ප්‍රේක්ෂාවට වැඩි අවධානයක් යොමු නොවිය යුතු ය.
(4) කාලය පැය එකකට වඩා වැඩි විය යුතු ය.
(5) උපදේශයට බර විය යුතු ය. (.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) නාට්‍ය කලාව හැර වෙනත් ප්‍රාසංගික කලා ප්‍රභේද **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)
(ii) මේවායින් **දෙකක්** පිළිබඳ වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
(iii) ඉහත සඳහන් කළ එක් කලාවක් නාට්‍ය කලාව හා සංසන්දනය කරමින් විමර්ශනයක් කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) රංග කලාවේ දී ප්‍රොසීනියම් වේදිකාව අදෘශ්‍යමාන ලෙස කොටස්වලට බෙදනු ලබන ආකාර **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි.)
(ii) එසේ වෙන් කිරීමෙන් ඇති ප්‍රයෝජන කවරේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
(iii) ලෝකධර්මී සම්ප්‍රදායේ නාට්‍යයක් සඳහා ප්‍රොසීනියම් වේදිකාවක ගගනිකාව කෙසේ ප්‍රයෝජනයට ගත හැකි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) නාට්‍යයකට සංගීතයෙන් ලැබෙන ප්‍රයෝජන **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි.)
(ii) ගායනය හා වාද්‍ය භාණ්ඩ භාවිතය හැරුණු විට නාට්‍යයකට සංගීතය සපයාගත හැකි වෙනත් ක්‍රම සඳහන් කොට ඒ ගැන පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
(iii) වේදිකා නාට්‍යයකට ජීවමාන සංගීතය යොදාගැනීම හා පටිගත කළ සංගීතය යොදාගැනීම පිළිබඳ ඔබේ අදහස් නිශ්චිත කරුණු යටතේ සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

## B කොටස

**4.** (i) ඇරිස්ටෝටල් කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති ශෝකාත්ම (tragedy) නාට්‍යයක මුඛ්‍යාංග හයෙන් 1 සිට 4 දක්වා අංග අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි.)
(ii) එහි පළමුවැනි අංගය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ රංග ශෛලිය ගැන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) මධ්‍යකාලීන යුරෝපීය ජන වන්දනා නාට්‍ය වර්ග හඳුන්වාදෙන්න. (ලකුණු 03 යි.)
(ii) ඒවායින් නාට්‍ය වර්ග **දෙකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)
(iii) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත පසන් හෙවත් පාස්කු නාට්‍ය සම්බන්ධ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) එළිසබෙතීන රඟහලක රංග භූමියේ ප්‍රධාන කොටස් නම් කරන්න. (ලකුණු 04 යි.)
(ii) එම කොටස් අතුරින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු වන කොටස ගැන පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) එළිසබෙතීන යුගයේ රංග ශෛලිය කෙරෙහි අවධානය යොමු කරමින් සමස්ත වේදිකාවේ නාට්‍යමය ශක්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

* * *

මෙහි කිසිවක් නොලියන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

**නාට්‍ය හා රංග කලාව - සිංහල II**
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

**57 S II**

**2018.08.16 / 0830 - 1140**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ......................................

| | |
|---|---|
| **I කොටස** | |
| **මුළු ලකුණු** | **40** |

**උපදෙස්:**

* **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

* එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

● **1** සිට **8** දක්වා ප්‍රශ්නවලට සපයා ඇති වරණ අතුරෙන් එක් වරණයක් කවර හෝ හේතුවක් මත සෙසු වරණ හා නොගැළපේ. එසේ **නොගැළපෙන** වරණය තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති හිස් තැන තුළ ලියන්න.

**1.** (1) ආලවක දමනය (2) පහන් මඩුව (3) යුගාසන බණ
(4) දොරකඩ අස්න (5) මිලින්ද ප්‍රශ්නය (.........)

**2.** (1) වඩිග පටුන (2) රාම මැරීම (3) අඹ විදමන
(4) මරා ඉපැද්දවීම (5) දෙවොල් ගොඩ බැසීම (.........)

**3.** (1) කපුයක්කාරිය (2) රන්ගිරි කූටය (3) රට යක්කු
(4) මල් මඩුව (5) කපාල කූඩුව (.........)

**4.** (1) ගබඩා කොල්ලය (2) ඉරුගල් බණ්ඩාර (3) කඩවත් තරණය
(4) දිවි දොස් (5) කතා පහ (.........)

**5.** (1) සංඛපාල (2) පිල්ලු වීදිය (3) දහඅටපාළි තොරණ
(4) අටමඟල (5) සූනියම් යක්ෂිණිය (.........)

**6.** (1) දුටුගැමුණු (2) ඇහැළේපොල (3) ශ්‍රී වික්‍රම
(4) පද්මාවතී (5) සිරිසඟබෝ (.........)

**7.** (1) යන්තම් ගැලවුණා (2) කඩවුණු පොරොන්දුව (3) වැරදුණු කුරුමානම
(4) සැඟවුණු පිළිතුර (5) කපටි ආරක්ෂකයා (.........)

**8.** (1) පිටිපන (2) දූව (3) පේශාලේ
(4) පමුණුගම (5) මඩකලපුව (.........)

[දෙවැනි පිටුව බලන්න.

**9.** සොකරි නාට්‍යයේ අනුරූපණ අවස්ථා ඇතුළත් වරණය තෝරන්න.
(1) සොකරි නාට්‍යයේ නළුවන් රංගනයට පෙර පේ වීම චාරිත්‍රයකි.
(2) නැවක් තැනීම, වී කෙටීම, ගොම ගෑම ආදි අවස්ථා අන්තර්ගත ය.
(3) චරිත කිහිපයක් සරල වෙස් මුහුණු පළඳති.
(4) කමත රංග භූමිය ලෙස යොදාගැනේ.
(5) ගුරුන්නාන්සේ විසින් චරිත හඳුන්වාදෙනු ලැබේ. (………)

**10.** නාඩගම් රංග ශෛලිය පිළිබඳ කියැවෙන වරණය තෝරන්න.
(1) 'හරිශ්චන්ද්‍ර' ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කරන ලද පැරණිතම නාඩගමයි.
(2) දේශීය කවි සඳහා නාඩගමේ ආභාසය ලැබී ඇත.
(3) පොතේගුරු හා ගායක පිරිසක් සිටී.
(4) මනමේ නාට්‍යය නාඩගම් ශෛලියේ ආභාසය ලබා ඇත.
(5) යුරෝපීය ජන වන්දනා නාට්‍ය කලාවේ ආභාසය ලබා ඇතැයි සැලකේ. (………)

**11.** කෝළම් නාට්‍යයේ රංග ශෛලියට අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) පාත්‍ර ප්‍රවේශයට හා කථා වස්තු හැඳින්වීමට අදාළ ගායනා හා සංවාද කාරියකරවන රාළ විසින් සිදු කරනු ලැබීම
(2) වෙස් මුහුණු භාවිතය
(3) නාට්‍යධර්මී ශෛලිය යොදාගැනීම
(4) ප්‍රභූ පන්තිය සරදමට ලක් කිරීම
(5) පිරිමින් පමණක් රංගනයේ යෙදීම (………)

- පහත දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් **12** සිට **16** දක්වා ප්‍රශ්නවලට උත්තර සපයන්න. එක ප්‍රශ්නයකට නාම තුනක් අදාළ වේ. එම නාමවලට අදාළ ඉංග්‍රීසි අක්ෂර ප්‍රශ්නය ඉදිරිපිට ඇති හිස්තැන තුළ යොදන්න.

| | | |
|---|---|---|
| A - විෂ්ණු | F - වෙන්බා | K - කිරි ඉතිරවීම |
| B - සූර්ය දේවයා | G - ලක්ෂ්මී | L - සරස්වතී |
| C - දුර්ගා | H - මන්මදන් | M - රතී |
| D - වීරපත්තිරන් | I - බ්‍රහ්ම | N - තිරුවිලා |
| E - කළරි | J - කුම්බම් | O - ශිව |

**12.** තෛපොංගල් උත්සවය හා සම්බන්ධ වන්නේ : (……… , ……… , ………)

**13.** මහාශිවරාත්‍රි උත්සවය හා සම්බන්ධ වන්නේ : (……… , ……… , ………)

**14.** නවරාත්‍රි උත්සවය හා සම්බන්ධ වන්නේ : (……… , ……… , ………)


**15.** කාමන් කුත්තු හා සම්බන්ධ වන්නේ : (……… , ……… , ………)

**16.** වඩමෝඩි කුත්තු හා සම්බන්ධ වන්නේ : (……… , ……… , ………)

**17.** 'කපුවා කපෝති', සිංහල නාට්‍ය ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙන්නේ,
(1) මෙහි ප්‍රධාන චරිතය මධ්‍යම පාන්තික සමාජ ජීවිතය නිරූපණය කරන බැවිනි.
(2) උඩු සිත හා යටි සිත අතර අරගලයක මැදි වූ චරිතයක් නිරූපණය කරන බැවිනි.
(3) ස්වාභාවික රංග ශෛලිය සිංහල වේදිකාවට හඳුන්වා දුන් බැවිනි.
(4) සරච්චන්ද්‍ර, විජේරත්න හා ගුණරත්න යන ලේඛකයන් සිංහල බසට නැගූ බැවිනි.
(5) විශාල ප්‍රේක්ෂක සහභාගිත්වයක් ලැබූ බැවිනි. (………)

**18.** ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 19 සියවසේ අග භාගයේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වූ පාසල් ඉංග්‍රීසි වේදිකා නාට්‍ය නිෂ්පාදනයට යොමු වූයේ නැත.
(2) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් නාට්‍ය නිෂ්පාදනය වූයේ නැත.
(3) ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලය 1874 දී ශේක්ස්පියර්ගේ නාට්‍යයක් නිෂ්පාදනය කොට ඇත.
(4) කොළඹ ලංකා විශ්වවිද්‍යාලය ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනයට යොමු වූයේ නැත.
(5) ඊ.එෆ්.සී. ලුඩොවයික් ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාව ගැන සිය අවධානය යෙදවූයේ නැත. (………)

● පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් අංක **19** සිට **23** දක්වා ප්‍රශ්නවලට උත්තර සපයන්න. ඡායාරූපවලට දී ඇති ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්නය ඉදිරියේ ඇති හිස්තැන තුළ යොදන්න.


A


B


C


D


E

**19.** දේශීය නාට්‍ය කලාවේ වේදිකා තාක්ෂණයට නව මුහුණුවරක් එක් කරමින් කැරකෙන වේදිකාව සිය නාට්‍යයක් සඳහා භාවිත කළ නාට්‍යකරුවා (.........)

**20.** නාට්‍ය අධ්‍යක්ෂවරයා සොඳුරු ආඥාදායකයෙක් වශයෙන් හැඳින්වූ නාට්‍යකරුවා (.........)

**21.** විශ්වවිද්‍යාලයීය නාට්‍ය ක්‍රියාවලිය ඔස්සේ ඉංග්‍රීසි නාට්‍ය කලාවට සේවය කළ මහාචාර්යවරයා (.........)

**22.** වීදි නාට්‍ය කලාවට, ඉංග්‍රීසි නාට්‍ය කලාවට හා පොදුවේ ශ්‍රී ලාංකීය නාට්‍ය කලාවට ඉමහත් දායකත්වයක් දැක් වූ නාට්‍යකරුවා (.........)

**23.** නාට්‍ය රචකයකු මෙන්ම සිංහල නවකතා රචකයකු ලෙස කීර්තියට පත් වූ නාට්‍යකරුවා (.........)

**24.** 'ඇන්ටිගනී' නාට්‍යයේ පහත සඳහන් ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් කා හට දැයි දැක්වෙන පිළිතුර තෝරන්න.
"එන්නට නම් නොසිතුවෙමි, මුල් වර ඔබතුමා කී සැඩ පරුෂ වදන් ඇසූ විට නැවත නොඑමැ යි දිවුරා කියා ගත්තෙමි, ඒත් හිමියනි අපේක්ෂා නොකොට ලැබෙන සතුට ඉහළම සතුට වෙයි."
(1) ගායන වෘන්දය විසින් රජුට (2) හීමන් විසින් රජුට
(3) රජු විසින් ටෙරේසියස්ට (4) ටෙරේසියස් විසින් රජුට
(5) මුර සෙබළා විසින් රජුට (.........)

**25.** 'ඇන්ටිගනී' නාට්‍යයේ සිවුවන අංකයේ අවසාන වෘන්ද ගායනයෙන් "වඩිනු මැන, වඩිනු මැන, නොයෙක විරුදාවලී දරණ දෙව්තුමනි වඩිනු මැන, කැඩ්මීන් මනාලිගෙ පුත් කුමරු..." ආදි වශයෙන් තුති ගී ගයන්නේ කුමන දෙවියන්ට ද?
(1) සියස් (2) දියොනීසස් (3) ඇපොල්ලෝ (4) ආටෙමිස් (5) ඇතීනා (.........)

**26.** ඇන්ටිගනී නාට්‍යයේ පූර්වරංගයට සහභාගී වන චරිත ඇතුළත් වරණය තෝරන්න.
(1) ඉස්මෙන් සහ ඇන්ටිගනී
(2) ඇන්ටිගනී සහ සෙබළා
(3) ක්‍රියොන් සහ ඇන්ටිගනී
(4) ගායන වෘන්දය සහ ඇන්ටිගනී
(5) හීමන් සහ ඇන්ටිගනී (.........)

**27.** අභිඥානශාකුන්තලයේ දැක්වෙන පහත සඳහන් ගීතය ගයන්නේ කවුද?
"සිඹින බමර පෙළ සෙමිනා – සුමුදු කෙසරු සිළු රඳනා
මහරි කුසුම් සැදු සවනා – සිටිති කොමළ ලියො සොබනා
(1) අනසූයා (2) ප්‍රියංවදා (3) සූත්‍රධාර (4) නටී (5) සානුමතී (.........)

**28.** අභිඥානශාකුන්තලයේ විදූෂක ගේ නාමය වන්නේ,
(1) වසන්තක ය. (2) මාඪව්‍ය ය. (3) මෛත්‍රේය ය. (4) ප්‍රේමසච්ච ය. (5) වෛහසික ය. (.........)

**29.** අභිඥානශාකුන්තලයේ ශකුන්තලා කැටුව හස්තිනාපුරයට යන පිරිස කවුරුන් ද?
(1) ශාර්ංගර්ව, ශාරද්වත සහ ගෞතමී
(2) ශාර්ංගර්ව, ප්‍රතීහාරී සහ ගෞතමී
(3) ශාරද්වත, කඤ්චුකී සහ සෘෂීහු
(4) ශාර්ංගර්ව, යෙහෙළියෝ සහ සෘෂීහු
(5) ප්‍රතීහාරී, ශාර්ංගර්ව සහ ගෞතමී (.........)

[හතරවැනි පිටුව බලන්න.

**30.** ජුලියස් සීසර් නාට්‍යයේ එන පහත දැක්වෙන සංවාදය කවුරුන් විසින් කියන ලද්දේ ද?
"දැන් මේ පොම්පේ ප්‍රතිමාව ළඟ දූවිල්ලක් වගේ වැටිල ඉන්න සීසර්, වේදිකාව මත දී කී වාරයක් නම් ලේ වගුරාවිද?"
(1) කැසියස් (2) ඩෙසියස් (3) සින්නා (4) බ්‍රූටස් (5) කස්කා (.........)

**31.** ජුලියස් සීසර් ඝාතනයට ලක්වන්නේ නාට්‍යයේ කී වැනි අංකයේ දී ද?
(1) දෙවන අංකය (2) තුන්වන අංකය (3) පස්වැනි අංකය
(4) පළමුවැනි අංකය (5) සිවුවැනි අංකය (.........)

**32.** ජුලියස් සීසර්ට පිළිගැන්වීමට පෙත්සමක් රැගෙන එන්නේ,
(1) පේන කියන්නා ය. (2) ලිගේරියස් ය. (3) සින්නා ය.
(4) පබ්ලියස් ය. (5) ආටිමිඩෝරස් ය. (.........)

**33.** 'ඔතෙලෝ' නාට්‍යයේ අන්තර්ගත පහත සඳහන් සංවාදය කියන ලද්දේ කවුරුන් ද?
"සත්තකින්ම නෑ; ඈට බැරිවෙලා ඒක බිම වැටුණා, ඉතින් වාසනාවට වගේ මම එතන ඉඳලා ඒක අහුලා ගත්තා"
(1) රොඩ්රිගෝ (2) ඉයාගෝ (3) එමිලියා (4) ඔතෙලෝ (5) කැෂියෝ (.........)

**34.** 'රූකඩ ගෙදර' නාට්‍යයේ නෝරා ළමුන් සමග සෙල්ලම් කරමින් සිටින විට ක්‍රොග්ස්ටඩ් පැමිණෙන්නේ කවර කරුණක් සඳහා ද?
(1) ණය වාරික ලබාගැනීමට
(2) හෙල්මු හමු වීමට
(3) පොරොන්දු පත්‍රය භාර දීමට
(4) තම රැකියාව අහිමි නොකරන ලෙස හෙල්මට බල කරන ලෙස පැවැසීමට
(5) ලින්ඩ මහත්මියට රැකියාවක් නොදෙන ලෙස පැවැසීමට (.........)

**35.** 'රූකඩ ගෙදර' නාට්‍යයේ දෙවන අංකය ආරම්භයේ පසුතලය සම්බන්ධ අනුචිත ප්‍රකාශය තෝරන්න.
(1) නත්තල් ගස පියානෝව අසල මුල්ලේ ය.
(2) එය විසිතුරු ලෙස ආලෝකවත් කොට ඇත.
(3) එහි අවුල් වූ අතු අග නිවිගිය ඉටිපන්දම් කැබැලි ය.
(4) සැරසිලි ගලවාදමා ඇත.
(5) නෝරා ගේ දිග කබාය හා හිස්වැස්ම වේදිකාව මත ය. (.........)

**36.** 'රූකඩ ගෙදර' නාට්‍යය සඳහා ඉබ්සන් අනුගමනය කළ රංග රීතියට අදාළ **නොවන** ප්‍රකාශය අන්තර්ගත වරණය තෝරන්න.
(1) මෙම නාට්‍යය 'පශ්චාද් දෘෂ්ටිමය' කථන ක්‍රමයට ලියැවී ඇත.
(2) එම රීතියට අනුව නාට්‍යය වර්තමානයේ ආරම්භ ව අතීත සිද්ධි අනාවරණය වේ.
(3) මෙම ක්‍රමය මුලින්ම අනුගමනය කළෝ ග්‍රීක ශෝකාත්මක නාට්‍යකරුවෝ ය.
(4) නළු-නිළි සංඛ්‍යාව සීමා වේ.
(5) මධ්‍යම පාන්තික කුටුම්බයක් කේන්ද්‍ර කොටගත් නාට්‍යයකි. (.........)

**37.** සුබ සහ යස නාට්‍යයේ ආරම්භක ජවනිකාවට පසුබිම් වන්නේ කුමන ස්ථානයක් ද?
(1) රාජ සභාව (2) අන්තඃපුරය (3) වනාන්තරය
(4) සිරියහන් ගබඩාව (5) මාලිගා අංගනය (.........)

**38.** "සුබ සහ යස" නාට්‍යයේ අන්තර්ගත පහත සඳහන් ප්‍රකාශය කවුරුන් කා හට කියන ලද්දේ දැයි දැක්වෙන වරණය තෝරන්න.
"සරදමින් විනෝදයක් ලබන්නේ යයි පසිඳු වී ඇත්තේ ඔබ වහන්සේ ය."
(1) සුබ විසින් යසට (2) නිර්මලා විසින් රජුට
(3) තුන්වැනි ඇමති විසින් රජුට (4) මහ ඇමති විසින් රජුට
(5) යස විසින් සුබට (.........)

**39.** "කෙසේ වුණත් රාග රාගිනී 36 ට අයිති නැති රාග තියෙන බවනේ ඒකෙන් පේන්නෙ"
"හස්තිකාන්ත මන්තරේ" පූර්ව උද්ධෘතය කවුරුන් විසින් කියන ලද්දේ ද?
(1) පජ්ජෝත රජ (2) උදයන රජ (3) වාසුලදත්තා (4) බිසව (5) ජේරුක (.........)

**40.** "හස්තිකාන්ත මන්තරේ" නාට්‍යයට ඇසුරු කරගත් කථා පුවත අන්තර්ගත මූලාශ්‍රයක් **නොවන්නේ**,
(1) බෘහත්කථා ය. (2) පඤ්චතන්ත්‍රය ය.
(3) කථාසරිත්සාගරය ය. (4) පාලි ධම්මපදට්ඨ කථාව ය.
(5) (සිංහල) සද්ධර්මරත්නාවලිය ය. (.........)

[පස්වැනි පිටුව බලන්න.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

**1.** (i) 60 දශකයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ නාට්‍ය **හතරක** නම් සහ ඒවායේ නිෂ්පාදකයන් ගේ නම් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත පිළිතුරට ඔබ ලියූ නිෂ්පාදකයන් **දෙදෙනකු** පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05 යි.)

(iii) 60 සහ 70 දශකවල පොදුවේ දේශීය නාට්‍ය කලාව පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) සුබ සහ යස නාට්‍යයේ නායකයා එහි ප්‍රතිනායකයා ප්‍රිය කිරීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) මෙම නාට්‍යයේ නායකයා හා ප්‍රතිනායකයා අතර ගැටුමක් පවතී ද? නැති ද? විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) නායක ප්‍රතිනායක චරිත දෙකින් වඩාත් විප්ලවකාරී ලෙස ඔබ සලකන්නේ කවුරුන් දැයි සඳහන් කර, එය කරුණු දක්වමින් සනාථ කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) "හස්තිකාන්ත මන්තරේ" නිෂ්පාදනය සඳහා නාට්‍යකරුවා ආභාසය ලබා ගත් රංග ශෛලි **දෙක** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) එම රංග ශෛලි දෙකෙහි ආභාසය නාට්‍යයෙහි විද්‍යමාන වන ආකාරය පෙන්වාදෙන්න. (ලකුණු 05 යි.)

(iii) 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යය විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි.)

### B - විදේශීය නාට්‍ය කලාව

**4.** (i) සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ හමුවන නායක වර්ග නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) 'අභිඥානශාකුන්තලයේ' නේත්‍රා ඉන් කුමන වර්ගයට අයත් වන්නේ දැයි දක්වා, ඊට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) අවස්ථා පංචකයේ ඉෂ්ටාර්ථය සිද්ධවන අවස්ථාව හෙවත් නියතඵලප්‍රාප්තිය සිදුවන්නේ 'අභිඥානශාකුන්තලයේ' කවර අංකයේ, කවර අවස්ථාවේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) 'ජූලියස් සීසර්' නාට්‍යයේ කැසියස් ගේ **හෝ** 'ඔතෙලෝ' නාට්‍යයේ ඉයාගෝ ගේ චරිතයේ **හෝ** දුර්ගුණ **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) ඉන් එක් චරිතයක් තෝරාගෙන නාට්‍ය විකාශයට එම චරිතයේ ඇති වැදගත්කම පහදන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත නාට්‍ය දෙකින් එකක් තෝරාගෙන පුද්ගලයකු ගේ සිත වැරදි මාර්ගයකට පෙළඹවීමට පූර්වෝක්ත චරිත සතු හැකියාව විවරණය කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) 'ඇන්ටිගනී' නාට්‍යයේ ඇන්ටිගනී හා 'රූකඩ ගෙදර' නාට්‍යයේ නෝරා කිසියම් අභීෂ්ටාර්ථ දෙකක් උදෙසා සටන් වදිති. එම අභීෂ්ටාර්ථ කවරේ දැයි ඔබේ අදහස අනුව පෙන්වාදෙන්න. (ලකුණු 04 යි.)

(ii) එකී අභීෂ්ටාර්ථ ඉදිරියේ ඔවුන් ගේ සාර්ථක අසාර්ථකභාවය සාකච්ඡාවට ලක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) රූකඩ ගෙදර නාට්‍යයේ සියල්ල සමථයකට පත් වුව ද නෝරා ගෙදරින් පිට ව යන්නේ මන්දැ යි පහදන්න. (ලකුණු 06 යි.)

※ ※ ※